*සැ. යු.* - මෙම ගැසට් පත්‍රයේ දෙමළ අනුවාදය වෙනම මුද්‍රණය කෙරේ.
2011.10.07 දින පළ වූ අංක 1,727 දරන ගැසට් පත්‍රයේ III කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,728 - 2011 ඔක්තෝබර් මස 14 වැනි සිකුරාදා - 2011.10.14**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත )

| | පිටුව |
|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... ... | 1634 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... ... | 1634 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | — |

*සැ. යු.* - (i) මෙත් සේවා පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2011 සැප්තැම්බර් මස 16 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

(ii) ගොවිජන සංවර්ධන (සංශෝධන) පනත් කෙටුම්පත 2011 සැප්තැම්බර් මස 23 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ***ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2011 ඔක්තෝබර් මස 21 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2011 ඔක්තෝබර් මස 07 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2011 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු - ඇබෑර්තු

සංශෝධනයයි

**බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු පිරවීම**

කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාව

2011.08.05 දිනැති අංක 1718 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සාමාන්‍ය *ගැසට් පත්‍රයේ* IV(ආ) වැනි කොටස - පළාත් පාලනය කොටසෙහි අංක 08-88 දැන්වීමෙහි පිටු අංක 1034 හි 2 වැනි ඡේදයේ 2011.08.12 යන දිනය ද, පිටු අංක 1035 හි 04 අයදුම් කළ යුතු ආකාරය යන උප මාතෘකාව යටතේ සඳහන් 2011.08.12 යන දිනය සහ පිටු අංක 1036හි ආදර්ශ අයදුම්පත්‍රයේ අංක 10 හි සඳහන් 2011.08.12 යන දිනය ද මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ඒ අනුව අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය 2011.11.04 ලෙස සංශෝධනය කරනු ලැබේ.

ලේකම්*(වැ.බ.),*
කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාව,

2011 සැප්තැම්බර් මස 20 වැනි දින,
ගොතටුව නව නගරය,
කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

10-230

# පළාත් පාලන නිවේදන

**මාවතගම ප්‍රාදේශීය සභාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 14 හා 24(2) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වැනි වගන්තිය ප්‍රකාර වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ මාවතගම ප්‍රාදේශීය සභාව විසින් මෙහි අමුණා ඇති උපලේඛනයේ දක්වා ඇති මාර්ගය මාවතගම ප්‍රාදේශීය සභාව සතු මංමාවතක් වශයෙන් ප්‍රකාශයට පත් කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මෙම මාර්ගය සම්බන්ධයෙන් අදාළ ඉඩම් අයිතිකරුවන් ලෙස හිමිකම් පාන පාර්ශවයන් විසින් යම් විරුද්ධතාවයක් පළ කරනු ලබන්නේ නම් මේ නිවේදනයේ සිට එක් මසක් ඇතුළත තමන්ගේ අයිතිය ඔප්පු කිරීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(2) වගන්තිය ප්‍රකාර ක්‍රියා කරන ලෙස මෙයින් දැනුම් දෙනු ලැබේ.

මෙම කාල සීමාව තුළ යම් විරුද්ධතාවයක් ඉදිරිපත් නොවුනහොත් උපලේඛනයේ සඳහන් මාර්ගය මාවතගම ප්‍රාදේශීය සභාව සතු මාවතක් වශයෙන් පිළිගෙන පාලනය කරන බව, පොදු ජනතාවගේ දැනගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරමි.

ඩබ්ලිව්. උපුල් පෙරේරා,
සභාපති,
මාවතගම ප්‍රාදේශීය සභාව - මාවතගම.

2011 සැප්තැම්බර් මස 22 වැනි දින,
මාවතගම ප්‍රාදේශීය සභාවේ දී ය.

**උපලේඛනය**

| | | |
|---|---|---|
| මාර්ගයේ නම | :- | වැවගෙදර වැල්හේනවත්ත පාර |
| ග්‍රා.නි. වසම | :- | 705, වැවගෙදර, |
| මාර්ගයේ දුර | :- | අඩි 420 |
| පළල | :- | අඩි 15 |
| මාර්ගය ආරම්භ වන ස්ථානය | :- | බරන්දන ප්‍රධාන පාරේ සිට වැවගෙදරට යන ගම මැද පාර |
| මාර්ගය අවසන් වන ස්ථානය | :- | ආර්. රාජපක්ෂ මයාගේ ඉඩම |
| මාර්ගය වම් පස ඉඩම් හිමියන් | :- | එච්. පී. ගුණරත්න මහතා<br>එම්. ප්‍රේමරත්න මහතා<br>එච්. එස්. ජයරත්න මහතා<br>ආර්. අකුරණගේ සිරිසේන මහතා<br>ආර්. රාජපක්ෂ මහතා |
| මාර්ගය දකුණු පස ඉඩම් හිමියන් | :- | අරුක්වත්ත මහතා |

10-320

**මහනුවර මහ නගර සභාව**

වාර්ෂික වරිපනම් බදු පැනවීම - 2012

252 අධිකාරය වන මහ නගර සභා ආඥාපනතේ 238 හා 239 වගන්ති ප්‍රකාර මහනුවර මහ නගර සභා බල ප්‍රදේශය තුළ පිහිටි සියලු දේපල වල පැවති වරිපනම් තක්සේරුව ප්‍රතිශෝධනය කර ඇති බවත්, එකී ප්‍රතිශෝධනය පදනම් කරගෙන 2012.01.01 වැනි දින සිට පහත උපලේඛනයේ සඳහන් පරිදි වාර්ෂික වරිපනම් තක්සේරුව හා ඊට අදාළ ප්‍රතිශතයක් මත වරිපනම් බදු පනවා අය කිරීමට මහනුවර මහ නගර සභාව තීරණය කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

| | *දේපල විස්තරය* | *වාර්ෂික වරිපනම් තක්සේරුව* මත 2012.01.01 වැනි දිනට අයකිරීමට නියමිත වරිපනම් ප්‍රතිශතය |
|---|---|---|
| 1. | ගෘහස්ථ දේපලක් සඳහා | 8% |
| 2. | ඉඩම්/පුරන් වූ කුඹුරු හා ගෘහස්ථ නොවන දේපල (වාණිජ) සඳහා | 12% |
| 3. | අස්වද්දන ලද කුඹුරු සඳහා | නිදහස්ය |

*2012 වසරට අදාළ වරිපනම් බදු ත්‍රෛයි මාසිකව :*

(i) පිළිවෙලින් මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30, දෙසැම්බර් 31 යන දිනයන් හිදී හෝ ඊට පෙර ගෙවිය යුතු බව නිවේදනය කරනු ලැබේ.

(ii) 2012 වසරට ගෙවිය යුතු මුලු වරිපනම් මුදලට 2012.01.31 වැනි දිනට හෝ ඊට පෙර ගෙවන්නේ නම්, 10% ක වට්ටමක් ද, කාර්තුවට අදාළ වරිපනම් බදු මුදල එකී කාර්තුවේ මුල් මාසය තුළ ගෙවන්නේ නම් 5% වට්ටමක් ද දෙනු ලැබේ.

(iii) නියමිත දිනට වරිපනම් බදු නොගෙවා ඇති සියලුම දේපල සඳහා මහ නගර සභා ආඥාපනතේ විධිවිධාන පරිදි ගෘහස්ථ දේපලක් සඳහා 15% ක වරෙන්තු ගාස්තුවක් ද ගෘහස්ථ නොවන දේපලක් සඳහා 20% ක වරෙන්තු ගාස්තුවක් ද එකතු කර අයකරන බව ද මෙයින් දැනුම් දෙනු ලැබේ.

චන්දන තෙන්නකෝන්,
නාගරික කොමසාරිස්,
මහනුවර මහ නගර සභාව.

2011 සැප්තැම්බර් මස 20 වැනි දින,
මහනුවර මහ නගර සභාවේ දී ය.

10-302/1

---

**මහනුවර මහ නගර සභාව**

2012 වර්ෂයේ තක්සේරු ලේඛනය

2012 වර්ෂය සඳහා වූ තක්සේරු ලේඛන දැනට සූදානම්ව ඇති බවත්, එම ලේඛන කාර්යාල වේලාවන්හි දී මෙම කාර්යාලයේ දී පරීක්ෂා කර බැලීම සඳහා තබා ඇති බවත්, 252 වැනි අධිකාරය වන මහ නගර සභා ආඥාපනතේ 235(1) වැනි වගන්තිය ප්‍රකාර මහජනයා වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ.

චන්දන තෙන්නකෝන්,
නාගරික කොමසාරිස්,
මහනුවර මහ නගර සභාව.

2011 සැප්තැම්බර් මස 20 වැනි දින,
මහනුවර නාගරික කාර්යාලයේ දී ය.

10-302/2

---

**වැලිගම නගර සභාව**

නගර සභා ආඥාපනතේ (255 වැනි අධිකාරය වන) 55 "අ" වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව කරනු ලබන නිවේදනය

වැලිගම නගර සභා බල ප්‍රදේශයට අයත්, වැලිගම වල්ලිවල, මහනැවියා පාරේ කොන්ක්‍රීට් කර ඇති අතුරු මාර්ගය වන වැලිකනත්ත පාර "තල්අරඹේ පියරතන නාහිමි මාවත" නමින් නම් කරනු ලබන බව මා විසින් මෙයින් නිවේදනය කරනු ලැබේ.

මොහොමඩ් හුසෙයින් හාජියාර් මුහම්මද්,
සභාපති,
වැලිගම නගර සභාව.

2011 සැප්තැම්බර් මස 05 වැනි දින,
වැලිගම නගර සභා කාර්යාලයේ දී ය.

10-231

## උඩුනුවර ප්‍රාදේශීය සභාව

### 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) වැනි වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) වගන්තිය ප්‍රකාර මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ, උඩුනුවර ප්‍රාදේශීය සභාව විසින් මෙහි පහත සඳහන් උපලේඛනයේ දක්වා ඇති මංමාවත් උඩුනුවර ප්‍රාදේශීය සභාව සතු මංමාවත් වශයෙන් ප්‍රකාශයට පත්කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ. මේ පිළිබඳව ප්‍රදේශයේ පොදු ජනතාව විසින් හෝ මංමාවත්වලට අදාළ ඉඩම්වල හිමිකරුවන් ලෙස හිමිකම් පාන පාර්ශවයන් හෝ යම් විරෝධතාවයක් පළකරනු ලබන්නේ නම් මෙම නිවේදනය *ගැසට් පත්‍රයේ* පළ වූ දින සිට එක් මසක් ඇතුළත තමන්ගේ අයිතිය ඔප්පු කිරීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(2) වැනි වගන්ති ප්‍රකාර ක්‍රියාකරන ලෙසට මින් දැනුම් දෙනු ලැබේ. එසේ එවන ලිපි ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

මෙම කාලසීමාව තුළ මෙම නිවේදනය පිළිබඳව යම් විරෝධතාවයක් ඉදිරිපත් නොවුවහොත් උපලේඛනයේ සඳහන් මංමාවත් උඩුනුවර ප්‍රාදේශීය සභාව සතු මංමාවත් වශයෙන් පිළිගෙන පාලනය කරනු ලබන බව පොදු ජනතාවගේ දැනගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත්කරමි.

ආර්. එම්. බන්දුල කුමාර සෙනවිරත්න,
සභාපති,

උඩුනුවර ප්‍රාදේශීය සභාව,
ගෙළිඔය.

| | *මාර්ගයේ නම* | *ආරම්භය* | *අවසානය* | *වම්පස ඉඩම් හිමි කරුවන්* | *දකුණු පස ඉඩම් හිමි කරුවන්* | *දිග* | *පළල* |
|---|---|---|---|---|---|---|---|
| 01. | අටලහේ සිට උනුම හරහා අටුවගාව දක්වා පාර | රංගොඩ ඇස්වැද්දුම පාර | අටුවගාව නවන්කුඹුර පාර | ඇම්. සිරිසේන<br>යූ. ජී. තිලකරත්න<br>එස්. ජී. ගුණතිලක | ඇම්. සිරිසේන<br>කේ. අයි. පී. ජී. එම්. වනිගසේකර<br>යූ. නිමල් චන්ද්‍රතිලක<br>ඒ. ජී. ගුණසිංහ<br>එම්. ජේ. කේ. තිලකරත්න | මීටර් 350 0 | අඩි 08 00 |
| 02. | වැලිමලුවේ සිට සක්කරේ වත්ත හරහා කුඩුමිරිස දක්වා පාර | වැලිමලුව (නාගහමුල) | කුඩුම්රිස ලීමෝල | ඩබ්. ජී. එච්. මනෝජ් කුමාර, බණ්ඩාර<br>ඩබ්. පී. එච්. හීන් බණ්ඩා හිටිබණ්ඩාර<br>ඩබ්. ජී. එච්. තිලකරත්න හිටිබණ්ඩාර | එන්.එම්. නිමල් නවරත්න<br>ඩබ්. එච්. එම්. එච්. හේරත් | මීටර් 475 0 | මීටර් 3 0 |
| 03. | උඩවත්තගම කර්මාන්ත කොටසට පිවිසෙන මාර්ගය | ඉලුක්වත්ත අඹගස් තැන්න මාර්ගයේ සිට | | ශ්‍රී වික්‍රම ගෙදර උදයරත්න<br>එදිරිසිංහ පේලිගෙදර ලලිත්<br>ඩබ්. පී. විජේරත්න<br>ඩබ්. පී. ගුණරත්න<br>ඩබ්. පී. සුසන්ත ධර්මරත්න<br>ඩබ්. පී. ප්‍රියන්ත ධර්මරත්න<br>ඩබ්. පී. ප්‍රියන්ත ධර්මත්න | ඩබ්. එම්. ජී. වීරසේකර<br>ඩබ්. පී. රෝහත ගයාන් කරුණාරත්න<br>ඩී. එම්. රුක්මන් දිසානායක<br>ඩබ්. පී. ජයතිලක<br>එම්. පී, ජේ. පී. ප්‍රේමරත්න<br>එස්. පී. එම්. ප්‍රේමරත්න<br>වයි. බී. එස්. ප්‍රේමතිලක | අඩි 675 0 | අඩි 10 0 |
| 04. | අලකොල අංගේ ගම පාර | අශෝකා ජයසේකර මහතාගේ නිවස | ඒ. ජී ජයසේකර මහතාගේ නිවස අසලින් | ඒ. ජී. අශෝක ජයසේකර<br>ඒ. ජී. නාලිනී සන්ධ්‍යා කුමාරි<br>එම්. ජී. ගුණසේකර<br>ඒ. ඩී. අනුලාවතී | ඒ. ජී. අශෝක ජයසේකර<br>ආර්. පී. ලීලාවතී<br>ආර්. පී. විජේරත්න<br>ඩී. යූ. ජයලත් ගුණරත්න | අඩි 600 0 | අඩි 8 0 |
| 05. | ඕග්‍රක්වත්ත හරහා අඹන්වල පාර | ගම්පළ කඩුගන්නාව ප්‍රධාන පාරේ 4/10 බෝක්කුව අසලින් | ලොකුඅංග සුසාන භූමිය | පද්මිණී අමරතුංග<br>එස්. පී. එල්. පෙරේරා<br>පී. කේ. ගුණතිලක | කේ. එම්. ප්‍රේමලතා<br>පී. ජී. පොඩිඅප්පුහාමි<br>සුනේත්‍රා බොගහවත්ත | මීටර් 1,500 | අඩි 12 0 |

| මාර්ගයේ නම | ආරම්භය | අවසානය | වම්පස ඉඩම් හිමි කරුවන් | දකුණු පස ඉඩම් හිමි කරුවන් | දිග | පළල |
|---|---|---|---|---|---|---|
| | | | ජේ. ජී. අබේරත්න බණ්ඩා<br>කේ. ජී. ප්‍රේමරත්න<br>යූ. එච්. එම්. වසන්ත<br>ඩී. එම්. රාජරත්න<br>ඒ. එස්. තෝරදෙණිය<br>කේ. එම්. එස්. ජයතිලක බණ්ඩා | ජේ. පී. කපුරුබණ්ඩා<br>කේ. ජී. ප්‍රේමරත්න<br>යූ. එච්. එම්. වසන්ත<br>ඩී. එම්. රාජරත්න<br>ඒ. එස්. තෝරදෙණිය<br>කේ. එම්. එස්. ජයතිලක බණ්ඩා | | |
| 06. කෝට්ටේගොඩවත්ත පාර | රේල් පාරෙන් මෙහා | යූ. ජී. වයලට් වසන්තා සහ බී. එල්. සමන්ත ගුණරත්න යන අයගේ නිවෙස් ලඟින් | ඩී. ඒ. ප්‍රියානි දෙල්ගහපිටිය<br>බී. එල්. එස්. එස්. පී. ගුණරත්න<br>එච්. එම්. ක්‍රිශාන්ති ගමගේ හේරත් | යූ. ජී. ජයනන්ද චන්ද්‍රසිරි<br>යූ. ජී. වයලට් වසන්තා | මීටර්. 480 | අඩි 4 0 |
| 07. ගල්කඩුව වටදෙණිය ප්‍රධාන මාර්ගයෙන් ජනපදවලට යන අතුරු පාර | වටදෙණිය නුවර පාර | බුලුගහතැන්න පාරට මායිම්ව | | එන්. ජී. විජේරත්න<br>කේ. යූ. ආනන්ද<br>එන්. ජී. සීලවතී | අඩි 105 0 | අඩි 4 0 |
| 08. දිහිට්දෙණිය කටුලියද්ද හරහා අඹකොටේ පාර | දිහිට්දෙණිය ආරාමයට | අඹකොටේ | එස්. ඩී. බී. අබේ සුන්දර<br>වයි. ඇම්. ඒ. ඩී. ඩබ්. සී. ආර්. යාපා<br>ඊ. ආර්. එම්. ගුණරත්න බණ්ඩා<br>වයි. එම්. දුමින්ද බණ්ඩාර | එම්. ආර්. ජයමැණිකේ<br>වයි. ඇම්. මුදියන්සේ<br>වයි. ඇම්. ජයන්ත යාපා බණ්ඩාර<br>පී. ආර්. ජයසිංහ බණ්ඩා<br>ආර්. එම්. ජයරත්න<br>පී. ඒ. තිලකරත්න<br>එම්. ජී. ආර්. චන්ද්‍ර රණතුංග | කි. මී.1.00 | අඩි 8 0 |
| 09. ඉහල පෙතියාගොඩ ගෝනදෙණිය හේන පාර | ඉහළ පෙතියාගොඩ එළදැත්ත වල්ලිවල | එම්. පී. ජී. කරුණාරත්න මයාගේ වැට මායිම | සී. එම්. ගුණතිලක<br>ටී. ඇලිස්<br>එම්. පී. නිමල්<br>එම්. ටී. ජී. ලලිත්<br>එම්. ජී. කරුණාරත්න<br>එම්. ජී. ගුණදරා | කේ. ජී. කරුණාරත්න<br>එස්. බී. ප්‍රියන්ත | අඩි 300 | අඩි 8 |
| 10. කොටකේදෙණිය පාර මීගම්පිටිය අතුරු මාර්ගය | කොටකේදෙණිය පාර | අතුරු මාර්ගය | පී. එම්. ඩිංගිරි මැණිකේ<br>පී. ජී. සමරසිංහ<br>පූජ්‍ය ගංගොඩ චන්දාලෝක හිමි | එම්. එම්. ජයන්ති මානගේ<br>ටී. එම්. පෙරමුණ ආරච්චිගේ | අඩි 120 | අඩි 10 |
| 11. බඹරගහඇල ජනපදයට යන මාර්ගයේ කනත්ත අසල වල පල්ලමේ කුඹුර හරහා යන මාර්ගය | කනත්ත අසල ඇල | නෝනාවත්ත මාර්ගය | ඒ. ජී. විමලාවතී<br>කේ. එන්. රූපසිංහ<br>එන්. වී. ඉන්ද්‍රානී | ඒ. ජී. විමලාවතී<br>කේ. එන්. රූපසිංහ<br>එන්. වී. ඉන්ද්‍රානී | අඩි 850 | අඩි 10 |
| 12. හෙට්ටි ගෙදර වත්ත පාර | හෙට්ටි ගෙදර වත්ත | හෙට්ටි ගෙදර වත්ත | ඩබ්. ඩබ්. ජී. එන්. ජයරත්න | එච්. එම්. ජී. යූ. කේ. නවරත්න<br>ආර්. එන්. ජයතිලක බණ්ඩාර | අඩි 230 | අඩි 10 |

10-334

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.